


# අකීකරු ළමයා


එල්.එම්.එස්.ඩී. සඳසේයා ලංකානායක

2 - E මහාමයා බාලිකා විද්‍යාලය
මහනුවර

# අකීකරු ළමයා

© එල්.එම්.එස්.ඩී. සඳසේයා ලංකානායක

ප්‍රථම මුද්‍රණය - 2023

ISBN 978-624-206-846-6

චිත්‍ර
නිර්මාණය:
**එල්.එම්.එස්.ඩී. සඳසේයා ලංකානායක**

ප්‍රකාශනය:
**මහාමයා බාලිකා විද්‍යාලය**

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකූර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ළදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# පිදුම

මට කීකරු හොඳ දරුවෙක්
වෙන්න මඟ කියා දෙන මාගේ
අම්මාටත් අප්පාච්චිටත්
ආදරණිය ගුරුතුමියටත්
ආදරයෙන් පුදමි.

ඔන්න එකමත් එක ගමක සඳුන් කියලා පොඩි ළමයෙක් එයාගේ අම්මයි, තාත්තයි සමඟ ජිවත් වුණා. ඒ සඳුන් අකීකරුැයි. අම්මා තාත්තා  කියන දේ අහන්නේම නෑ. දවසක් සඳුන් ඒයාගේ ගෙදර මිදුලේ සෙල්ලම් කරමින් සිටියා සඳුන්ගේ අම්මා සඳුන්ට අවවාද කළා. මිදුලේ පමණක් සෙල්ලම් කරන්න කියලා.

‘‘ සඳුන් පුතා මිදුලේ සෙල්ලම් කළාට කමක් නෑ... මිදුලෙන් එහාට යනන් එපා.. ’’

අම්මා කීවා.

‘‘හොඳයි අම්මා...’’

‘‘මම මිදුලෙමයි ඉන්නේ කොහේවත් යන්නේ නෑ’’

සඳුන් කීවා




ටික වේලාවකින් මිදුලේ සෙල්ලම් කරමින් සිටි සඳුන්ට ළඟ කැලෑව ඇතුලෙන් ශබ්දයක් ඇසුණා සඳුන් ඒ දිශාවට ගියා ගස්, මල්, පළතුරු පිරිලා.

ෂා ඇයි අම්මා මට මේ වගේ තැනකට එන්න දුන්නැත්තේ

සඳුන් හිතුවා

වනයේ තිබුණු පලතුරු ගස්, මල් ගස් බල බලා සඳුන් කැලේ ඇතුලටම ගියා. ටිකෙන් ටික වේලාව ගත වුනා. සඳුන් සතුන් බලමින් ඉන්නවා.



ටිකෙන් ටික අඳුර වැටුණා සඳුන්ට ගෙදර මතක් වුනා.

ගෙදර යන්න හැරෙන කොට කළුවර වැටිලා. රැහැයියන්ගේ හඬ නරියන්ගේ හඬත් ඇසෙනවා.

අනේ අම්මේ සමාවෙන්න ඔයා කිව්වදේ අහපු නැති නිසා මට මේ දේ වුනේ..




සඳුන් ඇඬුවා.

ටිකකින් ඈත එළියක් දිලිසෙනවා, සඳුන් දැක්කා.. අන්න එළීයක් සඳුන් හිතුවා එළිය තියෙන තැනට සඳුන් දිව්වා.



හැරමිටියක් ගත්ත සුදුම සුදු අත්තම්මා කෙනෙක් කොන්ඩේ සුදු පාටයි. කණ්නාඩි කුට්ටමක් දලා.

සඳුන් අත්තම්මා ළඟට ගිහින් විසතරේ අත්තම්මාට කිවුවා. අත්තම්මා සඳුන්ගේ කතාව අසා දරුවෝ දැන් ගෙදර යන්න බෑ රෑ වෙලා නිසා. අද මේහේ නවතිමු කියා අත්තාම්මා සඳුන්ට කිව්වා.



එතකොටත් සඳුන්ගේ අම්මයි තාත්තයි කලබලයෙන් සඳුන්ව සොයනවා. කැලෑවට ඇතුළුවෙන පාරක සඳුන්ගේ අතේ තිබුණ සෙල්ලම් බඩුවක් දුටු තාත්තා සඳුන් කැලෑව ඇතුලට යන්නට ඇතැයි සිතුවා.

ගමේ වැඩිහිටියන් සමඟ සඳුන් සොයන්න තාත්තා කැලයට ගියා.




දැන් නම් ගොඩක් රෑ වෙලා

ටික වෙලාවක් සඳුන්ව හොයනකොට අර එළියම තාත්තා දැක්කා.. හැමෝම ඒ එළිය තිබේන පැත්තට ගියා...

යනකොට තාත්තා දැක්ක සුදු අත්තම්මා එක්ක සඳුන් ඉන්නවා. තාත්තාට හරිම සතුටුයි.

සඳුන් තාත්තාට වෙච්ච හැම දේම කිව්වා.. අම්මායි තාත්තායි අත්තාම්මාට ස්තුති කරලා ගෙදර යන්න පිපටත් වුණා...



යහළුවනේ   දැක්කා නේද අම්මට තාත්තට අකීකරු වෙලා සඳුන්ට  වච්ච දෙයක්

අපි සඳුන් වගේ නොවී වැඩිහිටියන් කියනදේ අහලා හොඳ දරුවෙක් වෙමු.





# අතීකරු ළමයා

## එල්.එම්.එස්.ඩී. සඳසේයා ලංකානායක

### පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වු මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01

ISBN 978-624-206-846-6

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර